# උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMU) වශයෙන් ස්ථාපිත කොට ඇති විදේශ ආධාර ව්‍යාපෘතියක පහත දක්වා ඇති තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුරු

1. **අභ්‍යන්තර විගණක - (පුරප්පාඩු 01)**

තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දක්වා ඇත.

## I. අභ්‍යන්තර විගණක (PS 4)

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද :** (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් විගණනය/ ගණකාධිකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් මූලික උපාධියක් හෝ ගණකාධිකරණ ක්ෂේත්‍රය හා සම්බන්ද පිළිගත් වෘත්තීයමය ආයතනයක අන්තර්මාධ්‍ය විභාගය සමත් වී තිබීම.

   සමග

   විගණනය/ ගණකාධිකරණ ක්ෂේත්‍රයට අදාලව අවම වශයෙන් වසර 09 ක පූර්ව සුදුසුකම් සහිත පළපුරුද්ද.

2. විගණනය/ ගණකාධිකරණ ක්ෂේත්‍රයට අදාළ රජයේ දීප ව්‍යාප්ත සේවාවන් වල හෝ සමාන සේවා තත්ත්වයේ III/II හෝ ඊට ඉහළ පන්තිනට අයත් නිලධරයෙකු වීම.

   සමග

   III/II වන පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 11 ක පළපුරුද්ද ලබා තිබීම.

## කොන්දේසි :

1. **වයස් සීමාව :**

   අවුරුදු 65 ට අඩු.

2. **වැටුප :**

   මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 මත පදනම්ව ගෙවනු ලැබේ.

3. **සේවා කොන්දේසි :**

   මූලිකව වසර 1 ක කාලපරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත් කරනු ඇත. කාර්ය සාධනය මත පදනම්ව සේවය දීර්ඝ කිරීම සලකා බැලිය හැකිවනු ඇත.

4. **වෙනත් ප්‍රතිලාභ :.**

   සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් දායක කරනු ලබන 8% සඳහා ව්‍යාපෘතිය විසින් 12% ක් දායක කරනු ඇති අතර සේවක භාරකාර අරමුදල සඳහා 3% ක අතිරේක දායකත්වයක් සපයනු ඇත.

සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරමින් අයදුම්කරු පිළිබඳව තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ද සහිතව සකස් කරන ලද අයදුම්පත් 2016-12-30 දිනට පෙර **ලේකම්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, "මගනැඟුම මහමැදුර", අංක. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"අභ්‍යන්තර විගණක තනතුර සඳහා අයදුම් කිරීම"** යන්න සඳහන් කළ යුතුය. දැනටමත් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.

**ලේකම්,**
**උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය.**